ප්‍රංශ නාට්‍යවේදී මොලියේ(ර්) බටහිර
ලෝකයේ නාට්‍ය රසිකයින් අතර ඉතා ඉහළ
ිළිගැනීමක් ඇති කලාකරුවෙකි. මොහු
ිසින් රචනා කොට නිෂ්පාදනය කරන ලද
ාට්‍ය, විවිධ භාෂාවන්ට පරිවර්තනය වී
ැත. ප්‍රහසන ගණයට වැටෙන මෙම
විදිකා නාට්‍යය තුළින් එවකට ප්‍රංශ
මාජයේ විවිධ චරිතයන් උපහාසයට ලක්
ර ඇත. රචනය, අධ්‍යක්ෂණය, රඟපෑම
මන් ම නාට්‍ය කණ්ඩායම් කළමනාකරණය
න සියලු ම අංශවලින් කළ සේවය නිසා
මාලියේ(ර්) ට ප්‍රංශ ප්‍රහසන නාට්‍යකරුවන්
තර ප්‍රමුඛ ස්ථානයක් හිමි වේ. 1645 සිට
673 දක්වා වූ කාලය තුළ ඔහු විසින් රචිත
ාට්‍ය, ගණනින් 35 කට අධික ය. මේවායින්
ැඩි ප්‍රමාණයක් නාට්‍යානුසාරයෙන් රඟ
ක්වා ඇත.

වර්ෂ 1622 ජනවාරි 15 දින පැරිස් නුවර
උපත ලද මොලියේ(ර්) ගේ මුල් නම
ean-Baptiste Poquelin වූ අතර පසු
ලෙක මොලියේ(ර්) යන වේදිකා නාමයෙන්
සිද්ධියට පත් විය. ද්විතීක අධ්‍යාපනය
මාර කොට කෙටි කාලයක් නීතිය හැදෑරූ
හු 1641 දී නීතිඥවරයෙක් ලෙසට සිය
ෘත්තිය ඇරඹූ නමුත් එය කෙටි කාලීන විය.
ඩා වයසේ සිට ම වේදිකාවට දැඩි
ැල්මක් දැක් වූ මොලියේ(ර්) 1643 දී පූර්ණ
ාලීනව වේදිකාවට අවතීර්ණ වීමට තීරණය
ළේ ය. එවකට පැරිස් නුවර ප්‍රසිද්ධියට
ත් ව සිටි Madeleine Béjart(මැඩලේනි
බෙජාට්) නිළිය සමග ඔහුගේ ඇසුර මෙම
ීරණයට යම් දුරකට හේතු වූ බව සඳහන්
වේ. කලා පරපුරකින් පැවත ආ මැඩලේනි
672 ඇගේ මරණය දක්වා ම මොලියේ
මග ඇසුර පැවැත් වූවා ය. පසු කලෙක,
662 දී ඔහු විවාහ වූ අමෙන්ඩේ බෙජාට්
rmande Béjart මැඩලේනි ගේ සොහෙ-
යුරියක් බව සඳහන් වේ. Béjart සහ
ැගේ පවුලේ උදවිය සමග Illustre-

# මොලියර් මෙල්බර්න් වේදිකාවට

# ස්වාමිපුරුෂයන්ට පාසලක්

**සෑම් වීරරත්න විසින් පරිවර්තනය කොට, ප්‍රවීන නාට්‍යවේදී ජය ශ්‍රී චන්ද්‍රජිත් විසින් අධ්‍යක්ෂණය කොට ඉදිරිපත් කරනු ලබන 'ස්වාමි පුරුෂයන්ට පාසලක්' නාට්‍යය මෙම අප්‍රේල් මස 19 වන දින වේදිකා ගත වේ. අශාන් ඩයස්, සුලෝචනා විතානාරච්චි, මන්ජිත චන්ද්‍රජිත්, ජගත් මුණසිංහ, ශෙවන්ති නානායක්කාර, රයේෂ් ගුණසේකර, ගයනි මීමනගේ, ප්‍රසන්න හේවගේ සහ දේශාන් නෝනිස් ආදී ශිල්පීන් රංගන දායකත්වය දරති.**

Théâtre නමින් වේදිකා නාට්‍ය නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. මෙම ව්‍යාපාරයේ ණය තුරුස් නිසා 1644 වන විට දෙවතාවක් සිර ගත වීමට මොලියේ(ර්) ට සිදු වූ අතර, ව්‍යාපාරය බංකොලොත් විය. සිරෙන් නිදහස් වීමෙන් පසු ඔහු Béjart සහ අනිකුත් අය සමග වෙනත් ව්‍යාපාරයකට බැඳී අවුරුදු 13 ක් ම ප්‍රංශයේ නොයෙකුත් පළාත්වල නාට්‍ය රඟ දක්වමින් සැරි සැරූ බව සඳහන් වේ.

1650 දී මෙම නාට්‍ය සමාගමේ ප්‍රධානියා බවට මොලියේ(ර්) පත් විය.
ඔහුගේ නාට්‍ය කණ්ඩායමට 1658 දී 14 වන ලුවී රජතුමා (1638 - 1715) ඉදිරියේ රඟ දැක්වීමට අවස්ථාවක් ලැබුණි. මෙහි දී ඔවුන් රඟ දැක්වූ Le Docteur Amourex (The Doctor in Love) ප්‍රහසනය රජතුමාට මහත් ආශ්වාදයක් ගෙන දුනි. මොලියේ(ර්) නැවතත් තමන් උපන් පැරිසියේ පදිංචි වීමට යොමු වූයේ මෙසේ ලැබුණ රාජ අනුග්‍රහය නිසා බව සඳහන් වේ. වර්ෂ 1661 දී 'ස්වාමිපුරුෂයින්ට පාසැලක්' (School for Husbands) ප්‍රහසනය ඔහු විසින් රචනා කොට රඟ දක්වන ලදී. 1662 දෙසැම්බර්වල දී 'භාර්යාවන්ට පාසැලක්' (School for the Wives) නමින් රජතුමා ඉදිරියේ ඔහු ඉදිරිපත් කළ ප්‍රහසන නාට්‍යය ඉතා ප්‍රසිද්ධියට පත් විය. මැදි වයසේ පිරිමියෙක් විවාහ කර ගැනීමේ පරමාර්ථයෙන් දැරියක් තමන් භාරයේ හදා ගැනීම තේමාව කොට ගත් මෙම නාටකය එකල මහත් ආන්දෝලනයකට බඳුන් විය. ඔහුට රාජ අනුග්‍රහය ලැබීම ගැන ඊර්ෂ්‍යා කළ පිරිස මොලියේ(ර්) අශීලාචාර කෙනෙකැ යි චෝදනා කළ හ. එහෙත් පසුව නාටකය ගැන කළ ප්‍රසිද්ධ විවාදයකින් පසු එහි සාහිත්‍යමය වටිනාකම තහවුරු විය.

රාජ්‍ය අනුග්‍රහය ලද ප්‍රසිද්ධ නාට්‍ය-වේදියෙක් වූ නමුත් මොලියේ(ර්) දීර්ඝ කාලයක් අසනීප තත්වයෙන් පසු විය. බොහෝ කාලයක් තිස්සේ තද බල කැස්සකින් පීඩා විඳ ඇත. වේදිකාව මත දී කැස්ස සෑදුණ විට එය ප්‍රේක්ෂකයින් සිනා ගන්වන අයුරින් කිරීමට ඔහු පුරුදු වී සිටියේ ය. කෙතරම් පීඩාකාරී වූවත් ඒ සඳහා නිසි ලෙස ප්‍රතිකාර ගැනීම ඔහු ප්‍රතික්ෂේප කර ඇත. 1673 පෙබරවාරි 17 දින Le Malade Imaginaire නාටකය රඟ දක්වමින් සිටිය දී වේදිකාව මත දී ම තදබල ලෙස ඔහු රෝගාතුර විය. එදින ම රාත්‍රියේ මොලියේ(ර්) අවසන් හුස්ම හෙළී ය. ඔහුගේ අවසාන මොහොතේ ඔහු අසල සිටියේ සාත්තු සේවිකාවන් දෙදෙනෙක් පමණක් බවත්, අවසාන මොහොතේ කරන පාපොච්චාරණය සඳහා සහභාගි වීමට පූජකවරුන් පැමිණීම ප්‍රතික්ෂේප කළ බවත් සඳහන් වේ. ■


Alpha academy
Classes at Dandenong

Selective entry school exam preperation
Primary, Secondary, VCE
2015 Program

Primary & Secondary - Mathematics, Science and English
VCE - Biology, Chemistry
VCE English - Recommended Texts Analytical Writing

Classes conducted by Current School Teachers
Contact - Sarah on 0457 908 918
ABN 52267352093

PRINTING
සමරු කළාප
ප්‍රවේශපත්
මුද්‍රණය සහ
සැළසුම් කිරීම
Wijitha Kumara
Tripple Gem Creations
0412 083 876
Souvenirs & Tickets




Tutoring

22 years of experience in tutoring in Melbourne with Proven Results.......!

*Coaching for*
- Mathematics for Primary and Secondary
- VCE Mathematics: *Mathematical Methods, General Mathematics, Further Mathematics, Specialist Mathematics*
- VCE Physics
- English from Primary to year 9
- Science for Secondary

- Scholarship and Selective School exams
*Melbourne High, Mac.Robertson, Suzanne Cory, Uni High, John Monash, Ivanhoe Grammar, Trinity Grammar, Melbourne Grammar, PEGS, etc.*

Small groups - up to 4 students.....!
Individual classes on request

Neranjana Kudaligama
0408 356 821
Masters in Accounting (La Trobe)
B. Applied Science (Computer Science and Software Engineering) (Swinburne)
Civil Eng. (Moratuwa)
Ex. Teacher, VSL - Roxburgh Park Sinhala School

Hemantha Devendra
0409 854 597
VIT Registered Teacher
Post Grad. Dip Edu.(La Trobe)
B. Design (Industrial Design) (RMIT)
Mech Eng (Moratuwa)